නීතියෙන් දඬුවම් ලැබෙනා වරදක් සම්බන්ධ පුවත් වාර්තාවක් ඉදිරිපත් කිරීමේදී, එම වරදෙහි නිසි බරපතල කම නොදැක්වෙන, එම වරද සැහැල්ලු කොට දැක්වෙන ආකාරයේ පුවත් සිරස්තල හා පුවත් වාර්තාවන් සම්බන්ධයෙන් Ethics Eye අප කිහිප අවස්ථාවකම පාඨක අවධානය යොමු කොට ඇත්තෙමු.

"පෙම්වතියගේ නිරුවත් පින්තූර ඉන්ටර්නෙට් දැමූ කොළඹ අනංගයා ඔක්කම්පිටියේදී අල්ලයි" යන සිරස්තලය සමගින්, ලිංගික අපරාධයක් සහ නිරුවත් ඡායාරූප අන්තර්ජාලයට එක් කිරීමේ පුවතක් පිළිබඳව අරුණ පුවත්පතේ (12/08) පළවූ වාර්තාවද ඊට නිදසුනක් සපයයි.

1) වරදකරු "අනංගයෙකුට" ලඝු කරමින් ඉදිරිපත් වන මෙම සිරස්තලය ඔස්සේ, ලිංගික අපරාධයක සහ අපරාධයට මුහුණ පෑ අයගේ නිරුවත් ඡායාරූප මුදාහැරීමක ඇති බරපතල භාවය සන්නිවේදනය වේ යැයි ඔබ සිතන්නේ ද?

2) මෙම පුවත් වාර්තාව හා දැක්වෙන කාටූනය ද, පුවත් වාර්තාවට භාවාතිෂය (sensationalised) බවක් එක් නොකරන්නේ ද? ඒ ඔස්සේ ද මෙම පුවත් වාර්තාවේ සඳහන් වන අපරාධය සුළු කොට නොදැක්වෙන්නේ ද?

3) මෙවැනි අපරාධකාරී ක්‍රියාවන් මෙසේ සුළු කොට දැක්වෙන පුවත් වාර්තාකරණයන් ඔස්සේ, එවැනි අපරාධ සාමාන්‍යකරණය (normalisation) වීමක් සිදු නොවන්නේ ද?

4) එසේම, "දූෂණය" යන යෙදුම ඔස්සේ ලිංගික අපරාධයකට මුහුණ පෑවෙකු (survivor) අපවිත්‍ර වූ බවක් ගම්‍ය කරවන බැවින්, එතැනට වඩාත් උචිත යෙදුම වන්නේ ලිංගික අපරාධය යන්න නොවේද?

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?